සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2789

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2019**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.......................................................... විභාග අංකය:-..........................................................

- සැලකිය යුතුයි:

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව II උඩරට නර්තනය III පහතරට නර්තනය IV සබරගමු නර්තනය යන කොටස් වලින් ඔබ හදාරණ කොටස තෝරා ගෙන ප්‍රශ්න 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| I හා II පත්‍රය | = | 100 x 0.6 = 60 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | 100 x 0.4 = 40 |
| අවසාන ලකුණු | = | 100 |

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සාමූහික බව හා සරල බව යන ප්‍රධාන ලක්ෂණ තිබිය යුතු වන්නේ,
(1) ශාස්ත්‍රීය නැටුමක ය. (2) වන්නම් නැටුමක ය.
(3) නිර්මාණී නැටුමක ය. (4) ගැමි නැටුමක ය.

02. සිත කම්පා කරන සිදුවීමක් දර්ශනය වූ කල්හි අප සිත් තුළ උපදින භාවය වනුයේ,
(1) භය (2) ශෝකය (3) හාස්‍යය (4) සතුට

03. ශාන්ති කර්ම ආශ්‍රිත කවි භාවිතයට ගනු ලබන්නේ.......................... නැටුමේදී ය.
(1) පන් නෙලීම (2) ගොයම් (3) චාමර (4) පතුරු

04. නර්තන මාධ්‍යයෙන් චරිතයක් නිරූපණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි. මින් නිවැරදි ප්‍රකාශය නො වන්නේ,
(1) චරිතයේ චරිත ස්වභාවය හඳුනා ගැනීම. (2) නිර්මාණයේ චලන ඒකාකාරී වීම.
(3) තල, දිසා හා සම්බන්ධතා යොදා ගැනීම. (4) භාවමය හැඟීම් උද්දීපනය වීම.

05. "ලාභක් විතර වී අව්වේ වනාලා"....... මෙම කවිය ගයනු ලබන්නේ
(1) ගොයම් කැපීමේ කවි වලදී ය. (2) කඩතුරා කවි වලදී ය.
(3) පන් නෙලීමේ කවි වලදී ය. (4) සොකරි කවි වලදී ය.

● ප්‍රශ්න අංක 06 සිට 09 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | බෙර පුහුල | කඩිප්පුව | සුසිර |
| B | කඩතිර | වෙදා | දේවදාසින් |

06. ගැටබෙරයේ කොටස් දක්වෙන තීරුව වන්නේ,

(1) A තීරුවේ 1 පේළියේ ය.
(2) A තීරුවේ 1 පේළියේ ය.
(3) B තීරුවේ 2 පේළියේ ය.
(4) A තීරුවේ 3 පේළියේ ය.

07. තම්මැට්ටම වාදනය සඳහා යොදා ගනු ලබන උපකරණය දක්වෙන්නේ,

(1) A තීරුවේ 3 පේළියේ ය.
(2) B තීරුවේ 2 පේළියේ ය.
(3) B තීරුවේ 2 පේළියේ ය.
(4) A තීරුවේ 2 පේළියේ ය.

08. ශාන්ති කර්මවලදී රංග සැරසිල්ල ආවරණය යොදා ගන්නා සුදු පිරුවටය හඳුන්වන නාමය දක්නට ඇත්තේ,

(1) A තීරුවේ 1 පේළියේ ය.
(2) B තීරුවේ 2 පේළියේ ය.
(3) B තීරුවේ 1 පේළියේ ය.
(4) A තීරුවේ 2 පේළියේ ය.

09. දෙවියන් උදෙසා පුද පූජා නැටුම් පැවැත් වූ කාන්තාවන් හඳුන්වන නාමය දක්නට ඇත්තේ,

(1) B තීරුවේ 2 පේළියේ ය.
(2) B තීරුවේ 3 පේළියේ ය.
(3) A තීරුවේ 2 පේළියේ ය.
(4) A තීරුවේ 3 පේළියේ ය.

10. 

මෙම රූපයෙන් දැක්වෙන්නේ,

(1) දිල්ලි කථක් කේන්ද්‍රයයි.
(2) අඩයාර්හි කලා ක්ෂේත්‍රම් ආයතනයයි.
(3) ශ්‍රී පාලි ආයතනයයි.
(4) භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලයයි.

● නිවැරදි පිළිතුරට අදාළ වරණය තෝරන්න.

11. "රංගලීලා" නමින් නර්තන ප්‍රසංගය ඉදිරිපත් කරන ලද ශිල්පියා වනුයේ,
අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා / විල්සන් ඔලබොඩුව මහතා

12. ගොයම් නැටුම සඳහා යොදා ගනු ලබන රංග භාණ්ඩය
බුම්මැඩිය / දෑකැත්ත

13. ශාන්ති දේව ඝෝෂ් නිෂ්පාදනය කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍යය වනුයේ,
සැළළිහිණිය මුද්‍රා නාට්‍යය / සීතාහරණ මුද්‍රා නාට්‍යය

14. සොකරි කවි ගායනා කරනු ලබන බෙර පදය
/දොංජි / ජිගත /, දොං / ජිංත / ගත / දොංත/

15. තාලම්පටින් නිපදවන ශබ්ද ධ්වනි දෙක වනුයේ
තිත් තෙයි / තා තෙයි

## II උඩරට නැටුම්

16. නිවැරදි අංගහාර පවත්වා ගැනීම සඳහා උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ මෙන් පහතරට නර්තන සම්ප්‍රදායෙහි අභ්‍යාස කරනු ලබන්නේ,
(1) ඉලංගම් සරඹ ය. (2) අත් සරඹ ය. (3) දොඹින පදය (4) පා සරඹ ය.

17. අටවෙනි ගොඩ සරඹයෙහි සරඹ නාමය නම්,
(1) අංගහාර සරඹයයි. (2) අර්ධ චක්‍ර සරඹයයි. (3) දෑත පෑගීමේ සරඹයයි (4) ඇල හරඹයයි.

18. "පෙරත් කලෙක සිංහ රජෙක්" ........ යන කවිය සඳහන් වන්නේ,
(1) සිංහරාජ වන්නමේ ය. (2) මුසලඩි වන්නමේ ය. (3) හනුමා වන්නමේ ය. (4) තුරඟා වන්නමේ ය.

19. ගැට බෙරයෙන් වාදනය කළ හැකි බෙර පදයකි.
(1) ගුංද දෙගත ගතිගත ගුද (2) ජිං කිටිතත් තත් කිටිතක (3) ජිං ගත ගො ගො (4) කිත්තක දොම්කිට

20. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික පද වන්නේ,
(1) මාලක්කම් - කස්තිරම් (2) කස්තිරම් - ඉරට්ටිය (3) මණ්ඩිය - සුරල් (4) සීරුමාරුව - කස්තිරම

## II පහතරට නැටුම්

16. නිවැරදි අංගහාර පවත්වා ගැනීම සඳහා පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹ මෙන් උඩරට නර්තන සම්ප්‍රදායෙහි අභ්‍යාස කරනු ලබන්නේ,
(1) ගොඩ සරඹ ය. (2) පා සරඹ ය. (3) මණ්ඩි පද ය. (4) දොඹින පද ය.

17. අටවෙනි ඉලංගම් සරඹ පදය ආරම්භ වනුයේ,
(1) දොංතග දිතගත (2) ගුං දෑහිං ගුං දෑහිං (3) තරිකඩ දිරිකඩ (4) ගදිගත ගුදි ගුඳ

18. "තාරඟනා මැදිනා දිසි සුබ්‍ර කරා ලෙස..." යන කවිය සඳහන් වන්නේ,
(1) අනුරාග දණ්ඩ තාලය සින්දු වන්නමේ ය. (2) ඊශ්වර කුණ්ඩ තාලය සින්දු වන්නමේ ය.
(3) හනුමන්තා තාලය සින්දු වන්නමේ ය. (4) භවාදි තාලය සින්දු වන්නමේ ය.

19. යක් බෙරයෙන් වාදනය කළ හැකි බෙර පදයකි.
(1) ජිංගත ගො ගො (2) ජිං කිටිතත් තත් කිටිතක
(3) ගුංද දෙගත ගතිගත ගුද (4) කිත්තක දොම් කිට

20. පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික පද වන්නේ
(1) කස්තිරම - ඉරට්ටිය (2) මාලක්කම - ඉරට්ටිය
(3) මණ්ඩිය - කස්තිරම (4) ඉරට්ටිය - පා සරඹ

## IV සබරගමු නැටුම්

16. නිවැරදි අංගහාර පවත්වා ගැනීම සඳහා සබරගමු නර්තන සම්ප්‍රදායේ දොඹින පද මෙන් පහතරට නර්තන සම්ප්‍රදායෙහි අභ්‍යාස කරනු ලබන්නේ,
(1) ඉලංගම් සරඹ ය. (2) අත් සරඹ ය. (3) පා සරඹ ය. (4) ගොඩ සරඹ ය.

17. අටවෙනි දොඹින පදය ආරම්භ වනුයේ,
(1) තෙයියත් තා..... (2) තෙයි දොම්....... (3) කරතක් තක්කිට (4) තෙයියත් තත්තක....

18. "පානා යසසින් සිරි පිරි" ...... යන කවිය සඳහන් වන්නේ,
(1) විරාඩි වන්නමේ ය. (2) කදම්බ පක්ෂි වන්නමේ ය.
(3) අනිලා වන්නමේ ය. (4) කුදිරඩි වන්නමේ ය.

19. දවුලෙන් වාදනය කළ හැකි දවුල් පදයකි.
(1) ගුංද දෙගත ගතිගත ගුද (2) ජිංගත ගො ගො
(3) ජිං කිටිතත් තත් කිටිතක (4) දොම්කිට තක දොම්

20. සබරගමු නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික පද වන්නේ,
(1) කස්තිරම - කලාසම (2) මාලක්කම - කලාසම
(3) මණ්ඩිය - ඉරට්ටිය (4) කලාසම - මණ්ඩිය පද

## II කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

01. "විවිධ අත්දැකීම් ඇසුරු කරමින් කලාංග නිර්මාණ කරමු." පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
   (i) වී ගොවිතැන් කටයුතු විදහාපාමින් කරන නර්තනය සඳහා උපයෝගී කර ගත හැකි උපකරණ 02 ක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) එම උපකරණ භාවිත කරන නර්තනය නම් කරන්න. (ලකුණු 02)
   (iii) ඉන් එක් උපකරණයක් සාදා ගැනීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය ලියන්න. (ලකුණු 02)
   (iv) එම උපකරණය සෑදීම සඳහා ආකෘතියක් සකස් කරන්න. (ලකුණු 03)
   (v) උපකරණය සෑදීමෙන් අනතුරුව ඔබ ලද අත්දැකීම් විස්තර කරන්න. (ලකුණු 03)

02. (i) මාත්‍රා 4 + 4 තනි තිතට අදාල බෙර පදයක් / දවුල් පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
   (ii) මාත්‍රා තුනේ තනි තිතට නියමිත කවියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
   (iii) වෛරොඩි වන්නමේ අඩව්ව / ඊශ්වර කුණ්ඩතාලයේ ඉරට්ටිය / කදම්හ පක්ෂි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

03. "සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි"
   (i) පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ග කර දක්වන්න. (ලකුණු 03)
   (ii) පංචතූර්ය වාදනය යොදා ගන්නා අවස්ථා 03 ක් ලියන්න. (ලකුණු 03)
   (iii) උඩරට සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇඳ කොටස් 04 ක් නම් කරන්න. (ලකුණු 06)

04. "ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි තොරතුරු යටතේ ශාන්ති කර්ම හඳුනා ගනිමු"
   (i) දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අදාළව ඔබ උගත් ශාන්ති කර්මය පැවැත්වීමේ හේතු ලියා දක්වන්න. (ලකුණු 04)
   (ii) එම ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් ලියන්න. (ලකුණු 04)
   (iii) ශාන්ති කර්මය පැවැත්වීමේදී සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳව කරුණු 04 ක් ලියන්න. (ලකුණු 04)

05. "ශ්‍රී ලාංකේය නර්තන කලාව ඓතිහාසික පසුබිම මත බැඳී පවතී."
   (i) පහත දක්වෙන සංදේශ කාව්‍යයන් හා සෙල්ලිපි ඇතුලත් යුග නම් කරන්න.
   (අ) තිසර සංදේශය (ආ) සැළලිහිණි සංදේශය (ඇ) පරවි සංදේශය (ඈ) සැස්සේරුව සෙල්ලිපිය (ලකුණු 04)
   (ii) සංදේශ කාව්‍යයක එන නර්තන අංග යොදා ගත් අයුරු දක්වෙන කවියක් ලියන්න. (ලකුණු 04)
   (iii) පාලමොට්ටායි සෙල් ලිපියට අනුව එකල නර්තන කලාව පැවති අයුරු විස්තර කරන්න. (ලකුණු 04)

06. "වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදාය අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරමු." යටතේ
   (i) කථක් නර්තන ශෛලීන් (ඝරානා) හතර නම් කරන්න. (ලකුණු 04)
   (ii) කථක් නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය නම් කර වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න. (ලකුණු 04)
   (iii) කථක් නර්ථන අංග හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු ලියා දක්වන්න. (ලකුණු 04)

07. (i) ඔබ ඉගෙන ගත් ගීතයක් නම් කර එහි ගීත රචකයා සඳහන් කරන්න. (ලකුණු 02)
   (ii) එම ගීතයෙහි සුවිශේෂතා පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 05)
   (iii) ශාරීරික ස්වස්තථාව පවත්වා ගැනීම සඳහා නර්තනය යොදා ගෙන ඇති අයුරු පහදන්න. (ලකුණු 05)